# නිල්ල ගැහුවේ දුම්ගහ විතරයි



වෙලූ දුම්කොළ මිටිවලට බඳින අයුරු

කෘෂිකර්ම ව්‍යාප්ති සේවයක යුතුකම් එක හෙළා ඉටු කරන නිෂ්පාදන ව්‍යාපාරයක් තමා රාජාංගනේ දුම්කොළ වගාව. අවශ්‍යතා සියල්ල ගොවිපලටම ගෙනත් දෙනවා. ඊළඟට තියෙන්නේ වගා කරන එක. අස්වැන්නක් අඩුවක් නැතිව මිළට ගන්න කටයුතු යෙදිලා. ගොවි මහත්වරුන්ට මීට වඩා දෙයක් අවශ්‍ය නැහැ.


''අපිට කිසිදු අඩුවක් පාඩුවක් නැහැ. ඒ අතින්. දුම් ගහ නග්ග ගත්තොත් දෙයියෝ බැලුවා වගේ තමා''. දුම්කොල වගාවේ යෙදෙන එක් තරුණයෙක් කීය. ''කන්න පහ හයක් ම අපි හරිහැටි කරපු වගාවක් නැහැ. හේන් ද අළුවෙලා ගිහින්. නිල්ල ගැහුවේ දුම් පැලය විතරයි. කව්පි ටිකයි, දුම්කොළයයි තමා අපේ ජීවිත රැක්කේ''.

ලංකා දුම්කොල සමාගමේ රාජාංගන දුම් කොළ වගාව කදිමට සංවිධානය කරපු එකක්. දුම්කොල වගාව ගැන ගොවි මහත් වරුන්ට ආදර්ශ තවානේ දී මූලික උපදෙස්, දෙනවා. ඊළඟට පැල, අවශ්‍ය යෙදවුම්-පෝර රසායනික බෙහෙත්, කෘමි නාශක, ඉසින යන්ත්‍ර, වගා කටයුතුවලට අවශ්‍ය මුදල් දෙන ජංගම බැංකු සේවය, ගොවිපලට ම පැමිණ දෙන උපදෙස්, අවසානයේ අස්වැන්නට සහතික මිළක්, මුළු අස්වැන්නම මිළට ගැනීමේ සහතිකය. මේ මෙම ව්‍යාප්ති සේවය යටතේ කෙරෙන සේවාවන්.

අක්කරයක දුම් වගාවක් සඳහා දෙන මුළු ණය ප්‍රමාණය රු. 850 යි. බිම් සකස් කිරීම, පැල, පෝර, හා කෘෂි බෙහෙත් සඳහා ක්ෂේත්‍ර උපදේශක නිර්දේශ අනුව ණය මුදලේ මුල් කොටස ලැබෙනවා, රු. 500 ක්. මෙය කොටස් වශයෙන් දෙන්නේ, වගාවේ ඒ ඒ අවස්ථා වලට ගැලපෙන සේ. ගොවි මහතෙකුට වගා කළ හැකි වැඩිම අක්කර ගණන දෙකයි. අඩුම ගණන අක්කර බාගයයි. අක්කරයකට පැල 5000 ක් සමාගමේ තවානෙන් දෙනවා. පෝර රාත්තල් 125 ක් විතරත් ලැබෙනවා.

ක්ෂේත්‍ර උපදේශකවරුන් නිතර දෙවේලේ ගොවිපලට එනවා. කුණ්ඩසාලේ කෘෂිකර්ම අභ්‍යාස විද්‍යාලයේ දෙවසර පුහුණුවක් ලැබූ අයයි මේ සඳහා තෝරා ගන්නේ. ඊට පස්සේ ඔවුන්ට දුම්කොළ සමාගම මගින් දුම්කොල වගාව ගැන තවත් දැවුරුදු පුහුණුවක්. එක් උප දේශකයෙකුට ගොවි මහතුන් 125 කට වඩා භාර කරන්නේ නැහැ. පැල දීමේ ඉඳලා සමාගම දුම්කොළ මිළට ගැනීමට වර්ග කිරීම තෙක් හැම දෙයක් ම මෙම උපදේශකවරුන් ගේ දැනුම යටතේයි සිදු වෙන්නේ.

වගා ණයෙන් ඉතිරි රු. 350 සමාගම සැපයූ පැල ආදිය සඳහා අවස්ථා තුනකින් කැපෙන සේ ආපසු අයකර ගන්නවා. දුම්කොල වේලීම සඳහා පොල්අතු මඩුවක් සෑදීම, තෙල් ඉසින යන්ත්‍ර කුලියට ඉසින්නන් සමග ලබා දීමත් ක්ෂේත්‍ර උපදේශක නිර්දේශ හා අනුදැනුම ඇතිවයි කරන්නේ.



**දුම් මඩුවේ වේලන දුම්කොළද පරීක්ෂාවට ලක්වෙයි.**

රාජාංගනයේ දුම්කොල අක්කර 200 ක් තියෙනවා. අනුරාධපුරයේ අක්කර 1200 ක් විතර. සුළු වගාකරුවන්ට ලියා පදිංචි වගා කරුවන් මගින් තම දුම්කොළ අලෙවි කර ගන්න පුළුවන්.

අක්කරයකින් දුම්කොල රාත්තල් 1500 ක් විතර වේලා ගන්න පුළුවන්. දුම්කොල රාත්තලක සාමාන්‍ය මිළ රු. 3.50 තරම. හැම දුම් වගාකරුවෙක් ම බැංකු ඉතිරි කිරීමේ ගිණුම් හිමියෙක් විය යුතුමය. මහජන බැංකුව හා හැටන් නැෂනල් බැංකුව මේ සඳහා සංවිධානය වෙලා තියෙනවා. දුම්කොල සඳහා සමාගම ගෙවීම්කරන්නේ මෙම බැංකු ගිණුම්වලට. ඊට පස්සේ ගොවි මහත්වරුන්ට ඕනෑ එපාකම් අනුව මුදල් ගන්න පුළුවන්. බැංකු මගින් ජංගම සේවයක් ලබා දෙනවා. නියමිත දිනයන් හිදී බැංකුව ගමට එනවා.

ගොවි මහතුන් හොඳ පළ පුරුදු දුම් වගා කරුවන් කර තම තමන්ගේ තවාන් ඇති කර ගන්නා තත්වයට ගෙන ඒම දුම්කොල සමාගමේ එක් බලාපොරොත්තුවක්. ජනප්‍රිය සිගරට් වර්ග නිෂ්පාදනය සඳහා මෙම දුම් කොළ උපයෝගී කර ගැනීම මෙහි වගාවේ ඉහළ තත්වය කියාපාන්නක්. තම බැංකු ගිණුම් පවත්වා ගැනීමට අවශ්‍ය රුපියල් පහ පමණක් ඉතිරි කර ආදයම සියල්ලම එකවර ගැනීම ගොවි මහතුන්ගේ හිතකර නො වන පුරුද්දක් බවත් සමාගමේ නිලධාරියෙක් කීවා.

අවුරුදු ගණනාවක දැඩි නියඟයටත් ඔරොත්තු දීපු පැලයක් නිසා දුම් වගාව ප්‍රදේශයේ සැහෙන්න පැතිරිලා. ස්ථිර ආදයමක් ලැබීමත් තවත් රුකුලක්. මනා සංවිධාන කටයුතු මෙන්ම ගොවීන් සමග ළඟ සම්බන්ධතාවයක් තිබෙන නිසාත් දුම් වගාව සැහෙන්න පැතිරී යන බව වගාවේ නියැලෙන ගොවි මහත්වරුන්ගෙ අදහස යි.